රඹුක්කන ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රඹුක්කන ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කර තිබුණ රු.5,000,000 ක ස්ථාවර තැන්පත් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත නොකිරීම නිසා ආදායම් රු.241,506 කින් අඩුවෙන් දැක්විණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණු රු.145,475 ක් වටිනා වාහන 2 ක් සහ යන්ත්‍රයක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මෝටර් රථ හා කරත්ත ගිණුම ,යන්ත්‍රෝපකරණ ගිණුම හා ප්‍රාග්ධනයෙන් ආදායමට දායක වීමේ ගිණුම පිළිවෙලින් රු.75,475 කින් රු.70,000 කින් හා රු.145,475 කින් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ රු.21,000 ක් වටිනා ඉඩම් 02ක් හා ගොඩනැගිලි 01 ක් අත්පත් කරගෙන තිබූ නමුත් එම වත්කම් මූල්‍ය ප්‍රකාශන වල එකතු කිරීම් ලෙස දක්වා නොතිබීම නිසා ඉඩම් හා ගොඩනැගිලි හා ප්‍රාග්ධනයෙන් ආදායමට දායක වීමේ ගිණුම රු.21,000 කින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබියයුතු මුද්දර ගාස්තු රු.28,672,949 ක්, රු.11,143,299 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියෝ හා සමුච්චිත අරමුදල රු. 17,529,650 ක් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබියයුතු උසාවි දඩමුදල් රු.2,221,084 ක් රු.2,144,998 ක් ලෙස ගිණුම් තැබීම නිසා ආදායම් ණයගැතියෝ හා සමුච්චිත අරමුදලරු.76,086 කින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) කලින් ලද ආදායම් රු.1,195,397 ක් වුවත් එය රු.1,030,890 ක් ලෙස ගිණුම් තැබීම නිසා ජංගම වගකීම් රු.164,507 ක් අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) බැකෝ යන්ත්‍රය, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා බොබ්කැට් යන්ත්‍ර වලින් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.306,525 ක් ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඌ) 2015 වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.87,975 ක බැකෝ යන්ත්‍ර ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(එ) ස්ථාවර වත්කම් ලේඛනයට අනුව පැවති රු. 111,329,566 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කර නොතිබීම නිසා ඉඩම් හා ගොඩනැගිලි හා ප්‍රාග්ධනයෙන් ආදායමට දායක වීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ වියදම්, සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම්රු.141,105 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල වියදම් රු.14,005 ක් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 12 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.125,372,627 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.152,670,019 ක් වූයෙන් වෙනස රු. 27,297,392 ක් විය.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම පිළිවෙලින් රු. 2,380,507 ක් හා රු. 12,992,589 ක් විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| | ------------------------------- | ------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 (1) | වර්ෂයකට වැඩි කාලයක සිට අයවියයුතු රු.1,350,000 ක් වූ වරිපනම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 1988 අංක 56 හා 2000 අංක 53 පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත හා 2008 ජනවාරි 25 දිනැති අංක1533/16 ගැසට් පත්‍රය හා එම පනතේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස්මාලාව 1.2 හා1.1.6 වගන්ති | බලපත්‍ර කාලසීමාව අවසන් වී තිබුණු කර්මාන්ත 27 ක් බලපත්‍ර අළුත්කර ගෙන නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ.371 (2) ආ | තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිමකල විගස පියවිය යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.1,434,148 ක්විය. |
| (ii) | මු.රෙ.396 (ඇ) | නිකුත් කළ නමුත් මාස 06 ක් තුළ ගෙවීම සඳහා ඉදිරිපත් නොකරන ලද වටිනාකම රු. 84,254 ක්වූ චෙක්පත් 55 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මු.රෙ. 1646 | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් වාහන 12 කට අදාලව ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 10.4 වගන්තිය | සේවය හැරගිය නිලධාරිනියකගේ රු.58,300 ක් වූ ණය ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය | සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී ඒවායේ උස අනුව සංවර්ධන අවසර පත්‍ර හා පෙරසැරි ගාස්තු අයකළ යුතු වුවත් බල ප්‍රදේශයේ සවිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 14 ක් සඳහා රු.352,000 ක ගාස්තු අයකර නොතිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 20,595,422 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,327,341 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.268,081 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලයේ රු.268,081ක වර්ධනයට ආදායම් විෂයයන් 05 ක වැඩිවීම හා වියදම් විෂයයන් 04 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා සමුච්චිත හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිගය | 2016.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2016.12.31 දිනට හිගය<br>2016.01.01 දිනට පැවති හිගය | <br>වර්ෂයේ බිල්කිරීම් වලින් හිගය | <br>මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 2,205 | 855 | 5,740 | 5,116 | 1,350 | 624 | 1,974 |
| (ii) බදු කුලී | 751 | 32 | 8,189 | 8,237 | 719 | -48 | 671 |
| (iii) බලපත්‍ර ගාස්තු | 13 | 13 | 3,578 | 3,578 | 0 | 0 | 0 |
| (iv) වෙනත් ආදායම් | 19,278 | 31,016 | 78,126 | 50,854 | -11,738 | 27,272 | 15,534 |
| එකතුව | 22,247 | 31,916 | 95,633 | 67,785 | -9,669 | 27,848 | 18,179 |

2.3.2 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ආදායම්

දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපිත කර පවත්වා ගැනීම වෙනුවෙන් එක් කුළුණක් සඳහා රු.3,000 ක වාර්ෂික බද්දක් අයකරගත යුතු වුවත් එවැනි කුළුණු 08 ක් වෙනුවෙන් 2015 හා 2016 වර්ෂ වෙනුවෙන් රු.48,000 ක බදු අයකරගෙන නොතිබුණි.

(ආ) දැන්වීම් පුවරු ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ලිඛිත බලපත්‍රයක් මත අවසරය ලබාගතයුතු වුවත් එවැනි අවසරයකින් තොරව ප්‍රදර්ශනය කළ ප්‍රචාරක දැන්වීම් පුවරු 14 කින් රු.153,225 ක් අයකර ගෙන නොතිබුණි.

(ii) පෞද්ගලික අධ්‍යාපන ආයතන හා ගුරුවරු පිළිබඳ දැන්වීම් විශාල ප්‍රමාණයක් ප්‍රදර්ශනය කර තිබුණද ඒවායින් ගාස්තු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(iii) ඉඩම් වෙන්දේසි කිරීම ප්‍රදර්ශනය කිරීමට අවසර ලබාගත් ප්‍රමාණයට වඩා ප්‍රචාරක දැන්වීම් පුවරු 30 ක් ගාස්තු නොගෙවා ප්‍රදර්ශනය කර තිබුණි.

(iv) විවිධ වෙළඳසැල්වල ප්‍රදර්ශනය කර තිබුණු පෞද්ගලික දූරකථන සමාගමක ප්‍රචාරක දැන්වීම් සඳහා රු.108,000 ක් අයවීමට තිබූ නමුත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,090,714 ක් හා මුද්දර ගාස්තු රු. 5,600,783 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

2013 වර්ෂයේ කුඩා නගර සංවර්ධන සැළැස්ම යටතේ පළාත් සභා ප්‍රතිපාදන මත රු.23,746,095 ක පිරිවැයක් දරා 2014 අගෝස්තු 05 වැඩ නිම කරන ලද රඹුක්කන සති පොල 2017 මැයි 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන පැරණි පොලභූමිය තුළම සතිපොළ පවත්වා ගෙන යමින් තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සේවයේ නියුතු අනියම් සේවකයින් 17 දෙනෙකු 2014 ඔක්තෝබර් සිට රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලෙහි සාමාජිකයින් කරවා තිබුණු අතර එම සේවකයින් වෙනුවෙන් 2014 ඔක්තෝබර් සිට 2016 දෙසැම්බර් දක්වා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙතද සභා දායකත්වය වශයෙන් රු.81,023 ක්ගෙවා තිබුණි.

(ආ) නව වෙළඳ සංකීර්ණයේ ඉදිවන කඩකාමර 11 ක් ලබාදීමේදී ඇතිකරගත් ගිවිසුම්වල මාසික කුලිය සඳහන් කර නොතිබුණි.

(ඇ) 1997 වර්ෂය හා 2015 වර්ෂය අතර කාලය තුළ සේවක ණය ලබාගෙන ස්ථාන මරුවී ගිය සේවකයින් 09 දෙනෙකුගෙන් අයවිය යුතු ණය එකතුව රු.259,528 ක් විය.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට තනතුරු වර්ග 13 ක අනුමත සේවක සංඛ්‍යාව 90 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 86 ක් විය. අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 10 කනිලධාරින් / සේවකයින් 17 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර තනතුරු වර්ග 03ක නිලධාරින්/ සේවකයින් 13 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ කලින් පැවති කර්මාන්ත 07 ක් දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති නිසා බලපත්‍ර ලේඛනයෙන් ඉවත් කර තිබුණද ඒවා සත්‍ය වශයෙන් දැනට ක්‍රියාත්මක නොවන බව තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) 2015 නොවැම්බර් 20 දිනැති අංක 1942 දරනගැසට්පත්‍රය මගින් තාවකාලිකදැන්වීම් පුවරු එක් මාසයකට වඩා ප්‍රදර්ශනය කරන්නේ නම් අයකළයුතු ගාස්තු නිශ්චය කර නොතිබීම නිසා එක් මාසයකට වඩා ප්‍රදර්ශනය කරන දැන්වීම් වලින් ලැබිය යුතු ගාස්තු සභාවට අහිමිවී තිබුණි.

(ඇ) නව වෙළඳ සංකීර්ණයේ වැඩ නිමකරන ලද කඩ කාමර 05 ක් පැරණි කඩහිමියන් විසින් විවෘතකර තිබූ නමුත් 2016 මාර්තු 15 දින කළමනාකරණ කමිටුවේ තීරණය පරිදි රු.2,182,500 ක එක්වන් මුදල් (key money)හා රු.208,000 ක කඩකුලී අයකර ගැනීමට හා කඩහිමියන් සමඟ ගිවිසුමකට එළඹීමට 2017 පෙබරවාරි 06 දින වනවිටත් ක්‍රියාකර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂය හා 2016 වර්ෂය තුළ සභා බල ප්‍රදේශය තුළ ඉඩම් අක්කර 20 ක් අලෙවි කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් 2005 ජුනි 01 දිනැති අංක 2005/04 දරන සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය මගින් සභා බල ප්‍රදේශයේ ඉඩම් විකිණීම මත බදු අය කිරීමේ දී අනුගමනය කළයුතු ක්‍රමවේදය පැහැදිලිව ඉදිරිපත් කර තිබුණද ඉන් බැහැරව කටයුතු කිරීම නිසා කට්ටි සැළැස්ම අනුමත කිරීමට පෙර ආදායම් පරිපාලකගේ තාවකාලික තක්සේරුව මත සියයට 01 ක තැන්පත් මුදලක් ලබාගත යුතු වුවත් එසේකර නොතිබුණි. ඉඩම් කට්ටිවල ඔප්පු අංක යනාදි විස්තර ඇතුළත් වාර්තාවක් සමඟ අදාල බදු මුදල ගෙවන බවට ගිවිසුමකට එළඹිය යුතු වුවත් එළඹ තිබූ ගිවිසුමේ එය මාස 03 කින් ගෙවන බවට කොන්දේසි ඇතුළත් කර තිබුණි. ඉහත චක්‍රලේඛයේ (x)වගන්තිය ප්‍රකාරව සභාවේ ආදායම් පරිපාලක විසින් විකුණුම්කරු සපයා ඇති තොරතුරු වල නිරවද්‍යතාවය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් තහවුරු කරගත යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණු අතර ඔප්පු පිටපත් සභාව වෙත ලබාගෙන නොතිබුණි.

(ඉ) රඹුක්කන බණ්ඩාරවත්තේ අක්කර 12 රූඩ් 02 පර්චස් 19 ක ඉඩමේ බිම් කොටස් 145 කට වඩා විකුණා තිබුණු අතර එහි එක් පර්චස් එකක විකුණුම් තක්සේරු වටිනාකමට වඩා විකුණුම් මිල රු. 20,000 සිට රු.50,000 දක්වා ප්‍රමාණයකින් වැඩි බව අනාවරණය විය.ඒ අනුව විකුණුම් වටිනාකම තහවුරු කර ගැනීමෙන් තොරව සියයට 01 ක බදු මුදල් අය කිරීම නිසා අවම වශයෙන් රු.307,800 ක පාඩුවක් සභාවට සිදුවී තිබුණි. එසේම සභා බල ප්‍රදේශය තුළ අලෙවි කළ ඉඩම් 3 ක පර්චස් 819 ක ඉඩම් කොටස් 86 ක් සම්බන්ධයෙන්ද විකුණුම් වටිනාකම තහවුරු කරගෙන සියයට 01 ක බදු මුදල් අයකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ නියෝග අංක 22(1) අනුව හෙක්ටයාර් එකට වැඩිවන අවස්ථා වලදී වීථි අත්හැරීමෙන් පසු ඉඩමේ ප්‍රමාණයෙන් සියයට 10 ට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා සහ විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථාන වලින් වෙන්කළ යුතු වුවත් ඉඩම් දෙකකට අදාලව ඉහත පරිදි කටයුතු කිරීම වෙනුවට පොදු පහසුකම් සඳහා වෙන් කරන ලද කොටසද අඩු කිරීමෙන් පසු ඉතිරියෙන් සියයට 10 ක් වෙන් කිරීම හේතුවෙන් රු.957,500 ක අවම වටිනාකමක් සහිත පර්චස් 19.15 ක් සභාවට ලැබී නොතිබුණි.

3.4 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතු වන කසල මඟින් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ආරම්භ කර ඇති ව්‍යාපෘතිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩමක වාර්ෂික කුලී පදනම මත පවත්වාගෙනගොස් තිබූ අතර, එම කාර්යය සඳහා ස්ථිර භූමියක් සභාවට නොතිබුණි. එසේම කොම්පෝස්ට් නිෂ්පාදනයෙන් පසුව ඉතිරිවන කසල බැහැර කිරීමද එම ඉඩම තුළම සිදුකර තිබුණු අතර ප්‍රදේශය තුළ ජනිතවන කසල කළමනාකරණය කර බැහැර කරන ලෙස මහජනයා දැනුවත් කළද සභාව විසින් කසල වර්ගීකරණය කර එකතු නොකරන බව නිරීක්ෂණය විය.

4. <u>යහපාලනය හා ගිණුම් කටයුතු භාවය</u>

4.1 <u>වත්කම් කළමනාකරණය</u>

පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ සභාවේ ප්‍රයෝජනයට ගනු ලබන රු.26,610,000 ක් වටිනා වාහන 04 ක් හා සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබූ රු.12,695,150 ක් වටිනා වාහන 07 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම වත්කම් ගිණුම් වලින් අනාවරණය කර නොතිබුණි.

4.2 <u>අයවැය පාලනය</u>.

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසාතිබූ වැය විෂයන් 43ක එකතුව වූ රු.9,942,000 ක ප්‍රතිපාදන සියයට සියයක් ඉතිරි කර තිබූ අතර තවත් වැය විෂයන් 15ක ප්‍රතිපාදන වලින් සියයට 80 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක් වූ රු.6,792,971 ක් ද ඉතිරි කර තිබුණි. ඒ අනුව රු.16,734,971 ක් සභා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

4.3 <u>අභ්‍යන්තර විගණනය</u>

සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන නොතිබුණි.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) තැන්පත්,අත්තිකාරම්,සේවක ණය, ණයහිමි ලේඛන යාවත්කාලීන නොකිරීම |
| | | (ii) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (iii) උපචිත ආදායම් හා වියදම් අඩුවෙන් ගිණුම්ගත කිරීම |
| (ආ) | අයවැය පාලනය | (i) වැය ප්‍රතිපාදන වල සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරිව තිබීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) හිග ආදායම් අයකර නොගැනීම |
| | | (ii) සමහර දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය නොකිරීම |
| | | (iii) සමහර කර්මාන්ත සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු නොකිරීම |
| (ඈ) | වාහන පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) වාහන ලොග් පොත් යාවත්කාලීන නොකිරීම |